**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය - 2022**

**-------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1** තත්ත්වාගණනය කළ මතය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සුගතදාස ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------------ | -------------------------- | ----------- |
| (අ) | 2023 වර්ෂයට අදාල සාමාජික ගාස්තු සහ ක්‍රීඩාගාර වෙන් කර ගැනීමේ ආදායම රු. මිලියන 3.6 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන තිබීම හේතුවෙන් ආදායම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | සාමාජික ගාස්තු මුදල් පදනමට හඳුනාගෙන ඇත. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 18 ඡේදය ප්‍රකාරව කාල පරිච්ඡේදය අනුව මුදලින් ලද ගනුදෙනු පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල වාර්තා කල යුතු වුවද වටිනාකම රු. මිලියන 50 වූ ක්‍රීඩා හෝටලය අමාත්‍යාංශය මගින් අධිකාරිය වෙත පවරා දීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | එකඟවේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතුය. |
| (ඇ) | වර්ෂ 11 ක පමණ කාලයක සිට පැවත එන රු. මිලියන 9.3 ක් වූ ප්‍රත්‍යාගණන අතිරික්තය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 55 ඡේදය ප්‍රකාරව ඌණතාවයට මාරු කිරීමට හෝ අතිරික්තයෙන් යම් ප්‍රමාණයක් සමුච්චිත අතිරික්තයට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟවේ. ඉදිරියේදී සිදුකෙරෙන ප්‍රත්‍යාගණන මගින් සිදුවන ඌනතාවය හෝ අත්රික්තය මෙම ශේෂය හරහා ගලපා නිවැරදි කිරීමට කටයුතු සිදුකරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2022 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් භාවිතයේ පැවතුන රු. මිලියන 756 ක් වටිනා වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුව නැවත සමාලෝචනය කර ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. මේ වනවිට ප්‍රත්‍යාගණන කටයුතු ආරම්භ කර ඇති අතර, 2023 ජුනි 30 වනවිට අවසන් කර එම අගයන් පොත්වලට ගැනීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 69 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කමක් භාවිතයට ගැනීමට සුදුසු වූ දිනයේ සිට ක්ෂය ගණනය ආරම්භ කල යුතු වුවද අධිකාරිය විසින් 2022 වර්ෂයේ අත්පත් කරගත් වත්කම් සඳහා සම්පූර්ණ වර්ෂයටම අදාළ ක්ෂය වියදම ලෙස රු. මිලියන 5.6 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබීම නිසා රු. මිලියන 4.3 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | අප අධිකාරිය විසින් වත්කමක් මිලදී ගන්නා වර්ෂයේදී, එම වර්ෂය සඳහා සම්පූර්ණ ක්ෂය ගණනය කරන අතර, වත්කම ඉවත්කරන වර්ෂය සඳහා ක්ෂය ගණනය නොකරයි. මේ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන වල ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ අනු අංක 03 හි 3.1.4 යටතේ හෙළිදරව් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම රු. මිලියන 87.5 ක් දක්වා ඇතත් අධිකාරියට අනුව රු. මිලියන 90.5 ක් වූයෙන් ජංගම නොවන වගකීම රු. මිලියන 3 ක් අඩුවෙන් හා විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සඳහා වෙන් කිරීම් වියදම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සටහන් වලින් නිවැදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | **මූල්‍ය ප්‍රකාශන නිවරදිව පිළියෙල කල යුතුය.** |
| (ආ) 2017 සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ඉදිකිරීම් කටයුතු අවසන් කර මේ වන විට භාවිතයට ගනු ලබන කෙරිගෙන යන වැඩ තුළ ඇතුළත් රු. මිලියන 136 ක් අගය වූ ව්‍යාපෘති 05 ක් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දේපල පිරියත හා උපකරණ ක්ෂයවීම් රු. මිලියන 3 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ව්‍යාපෘති 2021 වර්ෂයේ අවසන් වූවකි. අවසන් බිල්පත් සහ රඳවා ගැනීමේ මුදල් නිදහස් කිරීමට ඇත. එම බිල්පත් නිදහස් කිරීමෙන් පසු වැඩ අවසන් කිරීමේ සහතිකය ලබා ගත හැකි අතර එම සහතිකය පදනම් කරගෙන කෙරීගෙන යන වැඩ ගිණුමෙන් ඉවත්කර ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ. | **වත්කම් භාවිතයට ගනු ලබන දිනයේ සිට ක්ෂය නිවැරදිව පරිදි ගණනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය.** |

| | | |
|---|---|---|
| (ඇ)වර්ෂ 09 ක කාලපරිච්ඡේදයක සිට පැවත එන රඳවා ගැනීමේ බදු රු. මිලියන 3.3 ක් අයකර ගැනීමට හෝ ගිණුම් වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයට අදාල පැරණි තොරතුරු සොයාගත නොහැකි බැවින්, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාකර ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවරදිව පිළියෙල කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට පැවති 2007 වසරේ සිට පැවත එන රු. මිලියන 26 ක් වූ ලැබිය යුතු වෙළඳ ශේෂය අයකර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. | එකඟවේ. | දීර්ඝ කාලයක සිට පැවත එන ලැබිය යුතු ශේෂ අය කරගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) වෙනත් ලැබිය යුතු දෑ තුල ඇතුලත් රු. මිලියන 22 ක් වූ ප්‍රග්ධන අත්තිකාරම් ශේෂයෙන් 2017 වර්ෂයේ සිට පැවත එන රු. මිලියන 11 ක ශේෂයන් හා වසර 05 ක සිට පැවත එන රු. 157,678 ක ශේෂයක් පැවතුනි. | 2023දෙසැම්බර්31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි කිරීම් කරනු ලැබේ. | දීර්ඝ කාලයක සිට පැවත එන ලැබිය යුතු ශේෂ අය කරගැනීමට කටයුතු කල යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙළඳ ගෙවිය යුතු දෑ තුල ඇතුලත් 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා එකතු වටිනාකම රු.476,239 ක් වූ වගකීම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟවේ.අධිකාරියේ ගිවිසුම්ගත කාර්යයන්වල පැවැති අඩුපාඩු නිසා මෙම ගෙවීම නතර කර ඇත. වර්තමානයේදී මෙම ගිවිසුම් සංශෝධනය කර ඇත. | වගකීම් අප්‍රමාදව නිරවුල් කල යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති 2014 වසරේ සිට පැවත එන එකතුව රු. මිලියන 86.9 වූ රඳවා ගත් මුදල් ශේෂ නිරවුල් කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි කිරීම් කරනු ලැබේ. | රඳවා ගත් මුදල් ශේෂ අප්‍රමාදව නිරවුල් කල යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | | | - |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 හා 891 (1) | මුදල් භාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඇප ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මෙම ක්‍රියාවලියේ මුල් පියවර අවසන් කර ඇති අතර, 2023 දෙසැම්බර් 31 වන විට ඇප ලේඛණය යාවත්කාලීන කරන බව කාරුණිකව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 93.8 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 16.2 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 110 පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම් ප්‍රදානයන් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------- | ---------- |
| (අ) 2019 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 49.8 ක් වූ සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ ප්‍රධාන පිවිසුම හා යකඩ වැට ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2020 මැයි 10 දිනට වැඩ අවසන් කළ යුතු වුවද ඒ සඳහා රු. මිලියන 31.7 ක් වැය කර වසර 03 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද වැඩ අවසන් කර නොතිබුණි | අවසන් කාර්යයන් කිහිපයක් ඉතිරිව ඇති බැවින් රඳවාගැනීම් නිදහස්කර නොමැත. 2023/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාග්ධනිත කර නිවැරදි කර ගැනීමට කටයුතු සිදු කරනු ලැබේ. | ඉදිකිරීම් කටයුතු නොපමාව නිම කිරීමට කටයුතු කල යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ප්‍රධාන පිහිනුම් තටාකය හා කිමිදුම් තටාකය සඳහා ස්ථාපිත පොම්පාගාරය 2010 වර්ෂයෙන් පසුව අලුත්වැඩියාවක් සිදු කර නොතිබුණි. 2020 වර්ෂයේ සිට මෙම පොම්පාගාරය අලුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවයක් ඇති වී තිබුණද එම මෙම අලුත්වැඩියාව සිදු නොකිරීමෙන් පැවති ජල කාන්දුව හේතුවෙන් නඩත්තු වියදම ද ඉහල ගොස් තිබුණි. නමුත් ආයතනය මෙතෙක් පොම්පාගාරය අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ.2021 ප්‍රතිපාදන සැලසීමට ඇතුලත් කර මුලධන ප්‍රතිපාදන වලින් සිදුකර ගැනීමට සියළුම කටයුතු සිදුකරන ලදී. | අලුත්වැඩියා කටයුතු කඩිනමින් නිම කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ | අධිකාරියේ ළමා ජල තටාකය ගිලා බැසීමට ලක්ව ඇති බැවින් පුහුණුවීම් සඳහා භාවිතා නොකරන අතර එය මෙතෙක් අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟවේ.මේ වන විට අළුවැඩියා කටයුතු ආරම්භ කර ඇති ඉදිරියේ දි අඩුපාඩු අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. | අලුත්වැඩියා කටයුතු කඩිනමින් නිම කිරීමට කටයුතු කල යුතුය. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෙරීගෙන යන වැඩ තුළ ඇතුළත් රු. මිලියන 18 ක පිරිවැය වූ සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ වට තාප්පය ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු 2019 සැප්තැම්බර් 18 වන දින ආරම්භ කර තිබූ අතර 2019 දෙසැම්බර් 18 දින නිම කළ යුතුව තිබුණි. රටේ පැවති කෝවිඩ් 19 වසංගත තත්ත්වය, අමුද්‍රව්‍ය හිඟකම හා කාලගුණික තත්ත්වයන් හේතුකරගෙන අදාළ උපදේශන ආයතනය විසින් කොන්ත්‍රාත් කාලය 2021 දෙසැම්බර් 21 දින දක්වා දීර්ඝ කරවාගෙන ඇතත් මේ වන විටත් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතියේ තිබූ ගැටළුකාරි තත්වය නිසා මේ වන විට ගිවිසුම් අවලංගු කර ඇත. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි කිරීම් කරනු ලැබේ. | ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ පාපන්දු පිටිය අලුත්වැඩියා හා වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 32 කට (බදු රහිත) පෞද්ගලික ආයතනයකට ලබා දී ක්‍රීඩාපිටිය භාවිතා කළ නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි. කොන්ත්‍රාත්කරු ලවා අඩුපාඩු සකස් කර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණ අතර රු. මිලියන 38 ක් වැයකරන ලද මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීමට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන සිදු වූ අලාභය අයකර ගැනීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එකඟ වේ. ක්‍රිඩා පිටියේ අඩුපාඩු නිමකර මේ වන විට භාවිතා කරන තත්වයකට සකස් කර ඇත. සියළුම පුහුණුවීම් සහ ක්‍රීඩා ඉසව් සඳහා ක්‍රීඩාපිටිය වෙන් කර ගත හැක. | විධිමත් පරිදි ව්‍යාපෘති කළමණාකරණය සිදු කර අපේක්ෂිත ඉදිකිරීම් නිසිපරිදි සිදුකර අප්‍රමාදව ඉදිකිරීම් අවසන් කල යුතුය. |
| (ඇ | 2019 වර්ෂයේදී ව්‍යාපෘති 04 ක් සඳහා වෙන් කරන ලද රු. මිලියන 37.6 ක් අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමකින් තොරව එම වර්ෂයේ සිට ප්‍රවර්ථන වර්ෂය දක්වා රඳවා ගෙන තිබුණි. | එකඟවේ. මෙම ව්‍යාපෘති ඉදිකිරීමේදි ගැටළු නිරාකරණය කර ගෙවීම් කටයුතු සිදු කල පසු ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රග්ධන ව්‍යාපෘති කඩිනමින් අවසන් කල යුතුය. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(II) වගන්තිය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සමාන මට්ටමකින් තරඟකාරී බව ප්‍රවර්ධනය කල හැකි බවට සහතික වීම පිණිස පිරිවිතර සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම සිදු කල යුතු වුවද අධිකාරිය විසින් රු. මිලියන 33.6 ක් වූ ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීමේදී එලෙස කටයුතු කර නොතිබුණි. | එකඟ වේ.ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර ඇත. නමුත් ඒ සඳහා මුදල් ගෙවීමේදී භාණ්වල අඩුපාඩු දක්නට ලැබුන හෙයින් ගෙවීම් කර නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) හා (ආ) වගන්ති ප්‍රකාරව ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි. | 2022 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා ප්‍රසම්පාදන කාලසටහන් පිළියෙල කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව විධිමත් පරිදි ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කල යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 379 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 288 ක් වූයෙන් 2022 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 91 ක් විය. එම පුරප්පාඩු තනතුරුවල ඇතුලත් ආයතනයේ කාර්ය සාධනය ඉහල නැංවීම උදෙසා තීරණ ගැනීමේ කාර්යයට සෘජුවම දායකත්වය සපයන අධිකාරියේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 10 කින් තනතුරු 05 ක් එනම් සියයට 50 ක් පුරප්පාඩුව පැවතුණි. | සත්‍ය අවශ්‍යතාවන් පිළිබඳ විශ්ලේෂණයක් සිදු කර 2023.12.31 අවසන් වර්ෂයේ බඳවා ගැනිමට කටයුතු කරනු ලැබේ. | අධිකාරියේ කාර්ය සාධනයට ඉවහල් වන පුරප්පාඩු පිරවීමට අප්‍රමාදව කටයුතු කල යුතුය. |